ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-----------------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) රු.325,000 ක් වටිනා ඉඩම් 02 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(අ) රු.429,440 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අයිතම 47 ක් ලී බඩු හා සවි කිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

1.3.2 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) <u>ලැබිය යුතු ගිණුම්</u>

අවුරුදු 05 ඉක්මවා තිබුණු ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.768,611 ක් විය.

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

අවුරුදු 05 ඉක්මවා තිබුණු ගෙවිය යුතු ශේෂවල එකතුව රු.132,142 ක් විය.

1.3.3 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>

හිමිකම තහවුරු කර ගැනීම සඳහා ඔප්පු හෝ පැවරුම් නියෝග ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.82,747,268 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි අයිතම 07 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.4 <u>අනුකූල නොවීම</u>

<u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | ------------------------------ | ------------------- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තිය | සභා බල ප්‍රදේශයේ පිහිටි දුරකථන කුළුණු 08 කින් 2016, 2017 හා 2018 වර්ෂවලට අදාළව ව්‍යාපාර බදු අය කර ගෙන නොතිබුණි. |
| (ආ) | 1971 අංක 48 දරන පළාත් පලාන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත හා 2008 දෙසැම්බර් 31 දිනැති අංක 434 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වර්ෂ 05 කට වරක් නව වරිපනම් තක්සේරුවක් කළ යුතු වුව ද, 2007 වර්ෂයට පසු නව තක්සේරුවක් සිදු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2017 මැයි 05 වන දිනැති අංක 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(ආ) | 2018 වර්ෂය සඳහා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ ප්‍රචාරක දැන්වීම් 17 කින් ගාස්තු අය කර ගෙන නොතිබුණි. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,466,363 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,821,559 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,136,000 | 2,330,256 | 2,431,826 | 1,199,914 | 1,936,000 | 2,046,294 | 2,041,893 | 1,422,056 |
| (ii) | කුලී | 5,419,000 | 4,467,906 | 5,212,972 | 512,524 | 4,623,000 | 4,362,359 | 4,404,259 | 882,364 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,220,200 | 1,324,116 | 1,841,016 | 351,200 | 1,220,200 | 990,800 | 1,007,300 | 36,000 |
| (iv) | වෙනත් ආදායම් | 13,386,400 | 21,198,677 | 5,504,487 | 27,668,898 | 20,044,500 | 14,118,358 | 13,018,502 | 9,151,964 |
| | එකතුව | 22,161,600 | 29,320,955 | 14,990,301 | 29,732,536 | 27,823,700 | 21,517,811 | 20,471,954 | 11,492,384 |

2.2.2 <u>වරිපනම් හා බදු</u>

(අ) <u>වරිපනම්</u>

(i) 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රජයේ දේපළවලින් අය විය යුතු රු.140,858 ක හිඟ වරිපනම් බදු අය කර නොතිබුණි.

(ii) වරිපනම් ඒකක 182 කින් වර්ෂ 05 කට පෙර සිට අය විය යුතු රු.727,698 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) හිඟ වරිපනම් අය විය යුතු වරිපනම් ඒකක 117 ක් වර්තමානය වන විට හඳුනාගත නොහැකි විය.

(ආ) <u>ජල ගාස්තු</u>

2003 වර්ෂයේ සිට යෝජනා ක්‍රම 07 ක ජල පාරිභෝගිකයින් 63 දෙනෙකුගෙන් අය විය යුතු රු.33,337 ක් ජල ගාස්තු අය කර නොතිබුණි.

(ඇ) <u>වෙනත් බදු</u>

සභාව විසින් බදු දුන් සභා ඉඩම් 04 කින් දීර්ඝ කාලීනව අය විය යුතු කුලී රු.152,766 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) <u>ත්‍රීරෝද රථ ගාස්තු</u>

2018 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචි ත්‍රීරෝද රථ 26 කින් අය විය යුතු රු.162,600 ක් අය කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

උසාවි දඩ රු.542,653 ක හා මුද්දර ගාස්තු රු.27,017,267 ක හිඟ ශේෂයක් පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

2018 වර්ෂය තුළ දී, සභා අරමුදල් යොදා ගනිමින් ඉටු කිරීමට සැලසුම් කර තිබූ රු.7,700,000 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 56 න් රු.2,930,742 ක සංවර්ධන ව්‍යාපෘති 18 ක කටයුතු ඉටු කර නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභා බල ප්‍රදේශයේ ව.කි.103.56 ක භූමි භාගයක පිහිටි දෛනිකව එකතු කරනු ලබන කසළ උළපනේ පිහිටි සභාව සතු ඉඩමක පස් දමා වසා දමන අතර, විධිමත් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙලක් නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) සභාව සතු ජල යෝජනා ක්‍රම 02 ක ජලය ක්ලෝරින් යෙදීම හෝ පිරිපහදු කිරීමකින් තොරව පාරිභෝගිකයින් 92 කට බෙදා හරිමින් තිබුණි.

(ආ) සභාව සතු කුරුඳුවත්ත නගරයේ පිහිටි ඉඩමක් 2017 වර්ෂයේ සිට ගිවිසුමකින් තොරව ලංකා බැංකු කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා බදු දී තිබුණි.

(ඇ) සභාව බදු දී තිබූ ඉඩම් 10 ක බදු කුලිය 2007 වර්ෂයෙන් පසු ප්‍රතිශෝධනය කර නොතිබුණි.

(ඈ) සභාව සතු ඇත්ගාල සති පොලෙන් ආදායමක් ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

(අ) අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩු තනතුරු 09 ක් හා එක් අතිරික්ත තනතුරක් පැවතුණි.

(ආ) විධිමත් ක්‍රමවේදයකින් තොරව බඳවා ගත් ඖෂධ සංයෝජකවරයෙකු ඖෂධ සම්බන්ධයෙන් කටයුතු කරන නිසා, ඖෂධ තොගවල ආරක්ෂාව සම්බන්ධව සභාව ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) බදු දී තිබූ කඩ කාමර 06 කින් අය විය යුතු රු.108,821 ක් වූ කාමර කුලි මාස 12 ක සිට මාස 24 ක් දක්වා කාලයක සිට හිඟව තිබියදීත්, ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව කඩ කාමර බදු දීමේ දී, බදුකරුවන් සමඟ එළඹ තිබූ ගිවිසුමේ 06 වන වගන්තිය ප්‍රකාරව, බදු කුළිය වර්ෂ 03 කට වරක් තක්සේරු කළ යුතු වුවත්, කඩ කාමර 53 ක බදු කුළිය 2010 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 පවරා නොගත් වත්කම්

(අ) සභා බල ප්‍රදේශයේ පිහිටි ප්‍රජාශාලා 26 ක් සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.172,990 ක් වූ යතුරු පැදි දෙකක් හා වටිනාකම හඳුනා ගෙන නොමැති ජීප් රථයක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

වටිනාකම රු.452,540 ක් වූ වත්කම් අයිතම 05 ක් හා වටිනාකම ගණනය කර නොමැති වත්කම් අයිතම 01 ක් වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා කාලයක සිට නිෂ්ක්‍රීයව/ ඌන උපයෝජිතව පැවතුණි.

3.6 ආර්ථික නොවූ ගනුදෙනු

සභාවේ කාර්යාල කටයුතු කළමනාකරණය කිරීම සඳහා වූ මෘදුකාංග පද්ධතියක් ලබා ගැනීමට අදාළව රු.780,000 ක් වැය කර, 2014 අගෝස්තු 22 දින සැපයුම්කාර සමාගම සමඟ ගිවිසුමකට එළඹ තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ක්‍රියාත්මක වූයේ වරිපනම් කළමනාකරණ පද්ධතිය පමණි. එමෙන්ම, මෘදුකාංගයේ විවිධ ගැටළු ඇති බව, හඳුනා ගෙන තිබිය දී, දෙවන වාරිකය වූ රු.300,000 ක මුදල හා ස්ථාපනය හා පුහුණුව අවසන් කළ පසු ගෙවිය යුතු රු.300,000 ක මුදල ද, එම කාර්යයන් ඉටු කිරීමට ප්‍රථම ගෙවා තිබුණි.